# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2224/9 - 2021 අප්‍රේල් මස 20 වැනි අඟහරුවාදා - 2021.04.20

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත**

3(2) වන වගන්තිය යටතේ වූ නිවේදනය

සංශෝධිත 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනතේ 3(2) වගන්තිය ප්‍රකාරව මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මුදල් අමාත්‍ය මහින්ද රාජපක්ෂ වන මා විසින්, මෙම නිවේදනය මගින් පහත දැක්වෙන පරිදි ප්‍රකාශයට පත් කරමි. එනම් -

(1) රටට ආර්ථික සහ සමාජීය ප්‍රතිලාභ ගෙනදෙනු ලබන්නාවූ ද, රටෙහි භූදර්ශනය වෙනස් කරනු ලබන්නාවූද, ජාතික සුභසිද්ධිය සලස්වනු ලබන ව්‍යාපෘතියක් වශයෙන්. විදේශීය/දේශීය රෙදිපිළි නිෂ්පාදකයන් විසින් කරනු ලබන ආයෝජන සඳහා පහසුකම් සැලැස්වීම පිණිස මඩකලපුව දිස්ත්‍රික්කයේ, එරාවූර් ප්‍රදේශයේ පිහිටි ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් අයිතිය දරනු ලබන අක්කර 400 ක භූමි ප්‍රදේශයක් තුළ (මෙහි මින්මතු "කලාපය" යනුවෙන් සඳහන් කරනු ලබන) "විශේෂිත රෙදිපිළි නිෂ්පාදන කලාපයක්" පිහිටුවීම සඳහා වූ ව්‍යාපෘතිය, ඉහතකී පනතේ කාර්ය සඳහා ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘතියක් වශයෙන් හඳුනා ගනිමි. මෙම ව්‍යාපෘතිය සඳහා, කර්මාන්ත විෂය භාර අමාත්‍යාංශය විසින් අවශ්‍ය යටිතල පහසුකම් සපයනු ලබන අතර, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිත ආයතනය වන්නේ ය.

(2) සංශෝධිත 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනතේ (මෙහි මින්මතු "SDP පනත" යනුවෙන් සඳහන් කරනු ලබන) 3(3) වගන්තිය ප්‍රකාර අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලැබීමේ දින සිට මාස විසි හතරක (24) ක කාලසීමාවක් ඇතුළත කලාපයේ යටිතල පහසුකම් අවශ්‍යතාවය සූදානම්වන බවට තවදුරටත් ප්‍රකාශයට පත්කරමි.

(3) ඉහත කී ව්‍යාපෘතියේ කාර්ය සඳහා, සංශෝධිත 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත ප්‍රකාරව, මෙම නිවේදනයේ පහත සඳහන් උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති යෝජිත නිදහස්කිරීම් මෙහිදී හඳුනාගෙන ඇති ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘතියේ විෂයපථය තුළට අයත්වන බවට ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය (BOI) විසින් හඳුනාගෙන ඇත්තාවූ ද කලාපය ඇතුළත පිහිටුවන ලද ව්‍යවසායයන් (මෙහි මින්මතු "ව්‍යවසායය" යනුවෙන් හඳුන්වනු ලබන) සඳහා අදාළ වියයුතු බවත්, ආයෝජනයේ ප්‍රමාණය, නිෂ්පාදනය කිරීමට නියමිත භාණ්ඩවල ස්වභාවය, වෙළෙඳපොළ සමග අනුගතවීම, දේශීය අගය එකතු කිරීම, යනාදී පරාමිතීන් මත පදනම්ව එකී එක් එක් ව්‍යවසායය සම්බන්ධයෙන් එම යෝජිත නිදහස්කිරීම් අභිරුචිකරණය (customized) කෙරෙනු ඇති බව නිශ්චිතව දක්වමි. ඉහත සඳහන් පරාමිතීන් මත පදනම්ව, උපලේඛනයේ (1) සිට (5) දක්වා වූ ඡේදවල සඳහන් දිරිගැන්වීම්වලින් තෝරාගත් දිරිගැන්වීම් ලබාගැනීම සඳහා එක් එක් ව්‍යවසායයන් යෝග්‍ය වන්නේ ය.



*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

(4) SDP පනතේ 3(5) වගන්තිය යටතේ මෙම කලාපය සඳහා පාර්ලිමේන්තුවේ අනුමතිය ලැබීමේ දින සිට බලාත්මක වන පරිදි, උපලේඛනයේ සඳහන් දිරිගැන්වීම් සෑම වසර පහකට (05) වරක්ම අධීක්ෂණය කර අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරනු ලබන අතර 3(4) ගැසට් නිවේදනයක් මගින් නිවේදනය කරනු ලැබේ.

(5) ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් මෙම දිරිගැන්වීම් ප්‍රදනය කළ යුතු අතර ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සහ ව්‍යවසායය අතර පවතින පෞද්ගලික ගිවිසුමෙහි (මෙහි මින්මතු BOI ගිවිසුම යනුවෙන් හඳුන්වනු ලබන) එම දිරිගැන්වීම් නිශ්චිතව දක්වනු ලැබේ.

**උපලේඛනය**

**(1) 2007 අංක 24 දරන දේශීය ආදායම් පනත**

**(අ) සංස්ථාපිත ආදායම් බද්ද (CIT) නිදහස් කිරීම්**

ව්‍යවසායය විසින් උත්පාදනය කරනු ලබන සමස්ථ ආදායම සඳහා පහත සඳහන් සංස්ථාපිත ආදායම් බදු ගෙවීමෙන් නිදහස් කිරීම්/බදු සහන ප්‍රදනය කරනු ලැබේ. එනම් -

| *ආයෝජනය (එ.ජ.ඩො. මිලියන)* | *අවම සේවා නියුක්තිය (ගණන)* | *වර්ෂ ගණන* | |
|---|---|---|---|
| | | *බදු විරාමය* | *එම අවස්ථාවේදී අපනයනකරුවන් සඳහා අදළ වන සහනදයි CIT බදු අනුපාතයෙන් 50%* |
| 10 ට වඩා විශාල හෝ සමාන හා 15 ට අඩු (>=10<15) | 150 | 5 | 2 |
| 15 ට වඩා විශාල හෝ සමාන හා 20 ට අඩු (>=15<20) | 200 | 7 | 2 |
| 20 ට වඩා විශාල හෝ සමාන හා 15 ට අඩු (>=20<25) | 300 | 8 | 3 |
| 25 ට වඩා විශාල හෝ සමාන හා 30 ට අඩු (>=25<30) | 350 | 9 | 4 |
| 30 ට වඩා විශාල හෝ සමාන (>=30) | 400 | 10 | 5 |

ව්‍යවසායය විසින් BOI සමග ගිවිසුම අත්සන් කරනු ලබන දිනයේ සිට වසර එක හමාරකින් (මාස 18කින්) පසුව එම බදු නිදහස් කාලසීමාව ගණනය කරනු ලැබිය යුතුය.

ඉහත කී බදු විරාම කාලසීමාව සහ බදු සහන කාලසීමාව අවසන්වීමෙන් පසුව, පහත සඳහන් පරිදි උත්පාදනය වන ආදයම සඳහා ; එනම් -

i. අපනයන ලෙස සලකනු ලබන අපනයන (deemed exports) ඇතුළු අපනයන තුළින් උත්පාදනය වන ආදයම් සඳහා එම අවස්ථාවේදී අපනයනකරුවන් සඳහා අදළවන සංස්ථාපිත ආදායම් බදු (CIT) අනුපාතිකය අදළ වන්නේ ය.

ii. දේශීය වෙළෙඳපොළ වෙත වෙනත් විකුණුම් හරහා සිදු කරනු ලබන ආනයන ආදේශන තුළින් උත්පාදනය වන ආදයම සඳහා, එම අවස්ථාවේදී නිෂ්පාදකයන් සඳහා අදළවන සංස්ථාපිත ආදයම් බදු (CIT) අනුපාතිකය අදළ වන්නේ ය.

**(ආ) සේවා නියුක්තිය මත ආදයම් බද්ද**

උපරිම වශයෙන් විදේශීය සේවා නියුක්තිකයන් දස (10) දෙනෙකුට යටත්ව වසර පහ (05) ක කාලසීමාවක් සඳහා ඉහතකී ව්‍යාපෘතිය සම්බන්ධයෙන් සේවයේ නියුක්ත වීමෙන් උත්පාදනය වන ලැබීම් සහ ප්‍රතිලාභ වෙනුවෙන් ආදයම් බදු ගෙවීමෙන් ව්‍යාපෘති සමාගමේ විදේශීය සේවානියුක්තිකයන් නිදහස් කරනු ලැබේ.

**(2) 2002 අංක 14 දරන එකතුකළ අගය මත බදු පනත**

පහත දැක්වෙන අයිතම සම්බන්ධයෙන් 2002 අංක 14 දරන එකතුකළ අගය මත බදු පනත සහ එහි සංශෝධන යටතේ වූ එකතුකළ අගය මත බදු (VAT) ගෙවීමෙන් සහ අයකිරීමෙන් ව්‍යවසායය නිදහස් විය යුතුය. එනම් -

i. ඉදිකිරීම් ආශ්‍රිත අයිතම

වයාපෘතිය ක්‍රියාත්මක කරනු ලබන කාලසීමාව තුළ දී, බන්ධිත ප්‍රදේශවලින් (ශ්‍රී ලංකා රේගුව හෝ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය) ලබාගන්නා මිලදී ගැනීම් හෝ දේශීය ආදායම් පිළිබඳ කොමසාරිස් ජනරාල්වරයා විසින් පරිපාලනය කරනු ලබන VAT පරිපාලන පද්ධතිය සමග (උදා : SVAT) ලියාපදිංචි වී ඇති යම් ලියාපදිංචි තැනැත්තකුගෙන් ලබාගන්නා සැපයුම් ඇතුළු සියලු ඉදිකිරීම් ආශ්‍රිත අයිතම ආනයනය කිරීම් මත ;

ii. අපනයන ලෙස සලකනු ලබන අපනයන (deemed exports) ඇතුළු අපනයන හා දේශීය වෙළෙඳපොළ වෙත විකුණුම් හරහා සිදු කරනු ලබන ආනයන ආදේශන යන අවස්ථා දෙකෙහිදීම නිෂ්පාදනය සඳහා භාවිතා කරන ප්‍රාග්ධන භාණ්ඩ (පිරියත, යන්ත්‍රෝපකරණ, උපාංග).

බන්ධිත ප්‍රදේශවලින් (ශ්‍රී ලංකා රේගුව හෝ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය) ලබාගන්නා මිලදීගැනීම් සහ දේශීය ආදායම් පිළිබඳ කොමසාරිස් ජනරාල්වරයා විසින් පරිපාලනය කරනු ලබන VAT පරිපාලන පද්ධතිය (උදා : SVAT) සමග ලියාපදිංචි වී ඇති යම් ලියාපදිංචි තැනැත්තකුගෙන් ලබාගන්නා සැපයුම් ඇතුළු සියලු ආනයන සම්බන්ධයෙන් වූ ප්‍රාග්ධන භාණ්ඩ ; සහ

iii. අපනයන ලෙස සලකනු ලබන අපනයන (deemed exports) ඇතුළු අපනයන සඳහා වූ නිෂ්පාදන මෙන්ම දේශීය වෙළෙඳපොළ වෙත විකුණුම් හරහා සිදු කරනු ලබන ආනයන ආදේශන නිෂ්පාදන සඳහා වූ අමුද්‍රව්‍ය සහ නිෂ්පාදන/සැකසුම් ආශ්‍රිත පරිභෝජන භාණ්ඩ.

බන්ධිත ප්‍රදේශවලින් (ශ්‍රී ලංකා රේගුව හෝ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය) ලබාගන්නා මිලදී ගැනීම් සහ දේශීය ආදායම් පිළිබඳ කොමසාරිස් ජනරාල්වරයා විසින් පරිපාලනය කරනු ලබන VAT පරිපාලන පද්ධතිය (උදා : SVAT) සමග ලියාපදිංචි වී ඇති යම් ලියාපදිංචි තැනැත්තකුගෙන් ලබාගන්නා සැපයුම් ඇතුළු සියලු අමුද්‍රව්‍ය සහ නිෂ්පාදන/සැකසුම් ආශ්‍රිත පරිභෝජන භාණ්ඩ ආනයනය කිරීම් මත ;

ඒ අනුව, ව්‍යවසායය විසින් දේශීය වෙළෙඳපොළ වෙත ලබාදෙන නිමි භාණ්ඩ අලෙවිය හරහා සිදුකරනු ලබන ආනයන ආදේශන සඳහා වැට් බදු (VAT) අය නොකළ යුතුය.

**(3) 2011 අංක 18 දරන වරාය සහ ගුවන් තොටුපල සංවර්ධන බදු පනත**

පහත දැක්වෙන ආකාරයට 2011 අංක 18 දරන වරාය සහ ගුවන්තොටුපල සංවර්ධන බදු පනත සහ එහි සංශෝධන යටතේ වරාය සහ ගුවන් තොටුපල සංවර්ධන බද්ද (PAL) ගෙවීමෙන් සහ අයකිරීමෙන් ව්‍යවසායය නිදහස් වන්නේ ය. එනම් -

i. වයාපෘතිය ක්‍රියාත්මක කිරීමේ කාලසීමාව තුළ දී, බන්ධිත ප්‍රදේශවලින් (ශ්‍රී ලංකා රේගුව හෝ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය) ලබාගන්නා මිලදී ගැනීම් ඇතුළු සියලුම ඉදිකිරීම් ආශ්‍රිත අයිතම ආනයනය කිරීම් මත ;

ii. අපනයන ලෙස සලකනු ලබන අපනයන (deemed exports) ඇතුළු අපනයන සඳහා වූ භාණ්ඩ සහ දේශීය වෙළෙඳපොළ වෙත සිදුකරනු ලබන අලෙවි කිරීම් හරහා සිදුකරනු ලබන ආනයන ආදේශන භාණ්ඩ යන අවස්ථා දෙකෙහිදීම නිෂ්පාදනය සඳහා භාවිතා කරනු ලබන, බන්ධිත ප්‍රදේශවලින් (ශ්‍රී ලංකා රේගුව හෝ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය) ලබාගන්නා මිලදී ගැනීම් ඇතුළු සියලුම ප්‍රාග්ධන භාණ්ඩ (පිරියත, යන්ත්‍රෝපකරණ, උපාංග) ආනයනය කිරීම් මත ; සහ

iii. අපනයන ලෙස සලකනු ලබන අපනයන (deemed exports) ඇතුළු අපනයන සඳහා වූ භාණ්ඩ සහ දේශීය වෙළෙඳපොළ වෙත සිදුකරනු ලබන අලෙවිකිරීම් හරහා සිදුකරනු ලබන ආනයන ආදේශන භාණ්ඩ යන අවස්ථා දෙකෙහිදීම නිෂ්පාදනය සඳහා වූ බන්ධිත ප්‍රදේශවලින් (ශ්‍රී ලංකා රේගුව හෝ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය) ලබාගන්නා මිලදී ගැනීම් ඇතුළු අමුද්‍රව්‍ය සහ නිෂ්පාදන/සැකසුම් ආශ්‍රිත සියලුම පරිභෝජන භාණ්ඩ ආනයනය කිරීම් මත.

ඒ අනුව, ව්‍යවසායය විසින් දේශීය වෙළෙඳපොළ වෙත නිමි භාණ්ඩ අලෙවි කිරීම හරහා සිදුකරනු ලබන ආනයන ආදේශන මත වරාය සහ ගුවන් තොටුපල සංවර්ධන බද්ද (PAL) අය නොකල යුතුය.

**(4) රේගු ආඥාපනත (235 වන පරිච්ඡේදය)**

රේගු ආඥාපනත (235 වන පරිච්ඡේදය) යටතේ පහත සඳහන් ආනයන මත රේගු බද්ද (CID) ගෙවීමෙන් සහ අයකිරීමෙන් ව්‍යවසායය නිදහස් වන්නේ ය. එනම් -

i. ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ කාලසීමාව තුළ දී බන්ධිත ප්‍රදේශවලින් (ශ්‍රී ලංකා රේගුව හෝ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය) ලබාගන්නා මිලදී ගැනීම් ඇතුළු සියලුම ඉදිකිරීම් ආශ්‍රිත අයිතම ආනයනය කිරීම් මත ;

ii. අපනයන ලෙස සලකනු ලබන අපනයන (deemed exports) ඇතුළු අපනයන සඳහා වූ භාණ්ඩ සහ දේශීය වෙළෙඳපොළ වෙත සිදුකරනු ලබන අලෙවි කිරීම් හරහා සිදුකරනු ලබන ආනයන ආදේශන භාණ්ඩ යන අවස්ථා දෙකෙහිදීම නිෂ්පාදනය සඳහා භාවිතා කරනු ලබන, බන්ධිත ප්‍රදේශවලින් (ශ්‍රී ලංකා රේගුව හෝ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය) ලබාගන්නා මිලදී ගැනීම් ඇතුළු සියලුම ප්‍රාග්ධන භාණ්ඩ (පිරියත, යන්ත්‍රෝපකරණ, උපාංග) ආනයනය කිරීම් මත ; සහ

iii. අපනයන ලෙස සලකනු ලබන අපනයන (deemed exports) ඇතුළු අපනයන සඳහා වූ භාණ්ඩ සහ දේශීය වෙළෙඳපොළ වෙත සිදුකරනු ලබන අලෙවිකිරීම් හරහා සිදුකරනු ලබන ආනයන ආදේශන භාණ්ඩ යන අවස්ථා දෙකෙහිදීම නිෂ්පාදනය සඳහා වූ බන්ධිත ප්‍රදේශවලින් (ශ්‍රී ලංකා රේගුව හෝ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය) ලබාගන්නා මිලදී ගැනීම් ඇතුළු අමුද්‍රව්‍ය සහ නිෂ්පාදන/සැකසුම් ආශ්‍රිත සියලුම පරිභෝජන භාණ්ඩ ආනයනය කිරීම් මත.

එසේ වුවද, මුදල් අමාත්‍යාංශය විසින් ප්‍රසිද්ධ කරනු ලැබූ නිශේධන ලේඛනයේ සඳහන් අයිතම ප්‍රමාණවත් ගුණාත්මක තත්ත්වයෙන්, ප්‍රමාණයෙන් සහ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ කාලසීමාව සඳහා අනුගතවන පරිදි ලබාගැනීමට නොමැති අවස්ථාවලදී, එම නිශේධන ලේඛනයේ සඳහන් අයිතම ආනයනය කිරීම ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ (BOI) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සලකා බැලිය යුතුය.

ඒ අනුව, ව්‍යවසායය විසින් දේශීය වෙළෙඳපොළ වෙත නිමි භාණ්ඩ අලෙවිය හරහා සිදුකරනු ලබන ආනයන ආදේශන වෙනුවෙන් රේගු බද්ද (CID) අය නොකළ යුතුය.

**(5) 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත**

පහත සඳහන් ආනයන සම්බන්ධයෙන් 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත සහ එහි සංශෝධන යටතේ සෙස් (CESS) බද්ද ගෙවීමෙන් සහ අයකිරීමෙන් ව්‍යවසායය නිදහස් වන්නේය. එනම් -

i. ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ කාලසීමාව තුළ දී බන්ධිත ප්‍රදේශවලින් (ශ්‍රී ලංකා රේගුව හෝ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය) ලබාගන්නා මිලදී ගැනීම් ඇතුළු සියලුම ඉදිකිරීම් ආශ්‍රිත අයිතම ආනයනය කිරීම් මත ;

ii. අපනයන ලෙස සලකනු ලබන අපනයන (deemed exports) ඇතුළු අපනයන සඳහා වූ භාණ්ඩ සහ දේශීය වෙළෙඳපොළ වෙත සිදුකරනු ලබන අලෙවි කිරීම් හරහා සිදුකරනු ලබන ආනයන ආදේශන භාණ්ඩ යන අවස්ථා දෙකෙහිදීම නිෂ්පාදනය සඳහා භාවිතා කරනු ලබන, බන්ධිත ප්‍රදේශවලින් (ශ්‍රී ලංකා රේගුව හෝ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය) ලබාගන්නා මිලදී ගැනීම් ඇතුළු සියලුම ප්‍රාග්ධන භාණ්ඩ (පිරියත, යන්ත්‍රෝපකරණ, උපාංග) ආනයනය කිරීම් මත ; සහ

iii. අපනයන ලෙස සලකනු ලබන අපනයන (deemed exports) ඇතුළු අපනයන සඳහා වූ භාණ්ඩ සහ දේශීය වෙළෙඳපොළ වෙත සිදුකරනු ලබන අලෙවිකිරීම් හරහා සිදුකරනු ලබන ආනයන ආදේශන භාණ්ඩ යන අවස්ථා දෙකෙහිදීම නිෂ්පාදනය සඳහා භාවිත කරනු ලබන, බන්ධිත ප්‍රදේශවලින් (ශ්‍රී ලංකා රේගුව හෝ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය) ලබාගන්නා මිලදී ගැනීම් ඇතුළු අමුද්‍රව්‍ය සහ නිෂ්පාදන/සැකසුම් ආශ්‍රිත සියලුම පරිභෝජන භාණ්ඩ ආනයනය කිරීම් මත.

ඒ අනුව, ව්‍යවසායය විසින් දේශීය වෙළෙඳපොළ වෙත නිමි භාණ්ඩ අලෙවිය හරහා සිදුකරනු ලබන ආනයන ආදේශන වෙනුවෙන් සෙස් (CESS) බද්ද අය නොකළ යුතුය.

**මහින්ද රාජපක්ෂ, පා.ම.**
මුදල් අමාත්‍ය.

2021 අප්‍රේල් මස 20 වැනි දින,
කොළඹ 01,
මුදල් අමාත්‍යාංශයේ දී ය.

05 - 09

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.